කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2008

**BMGT E 1035/ BMGT 13035 – ව්‍යාපාරික ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(01) (අ) ව්‍යාපාරිකයකු විසින් තනිපුද්ගල හැසිරීම මෙන්ම ආර්ථිකයේ සමස්ථ හැසිරීමද වෙන වෙනම හැදෑරිය යුත්තේ මන්ද?

(ලකුණු 06)

(ආ) පහත සඳහන් විස්තර කිසියම් භාණ්ඩයකට අදාළ වේ.

$$Qs = -50 + 100P$$
$$Qd = 25 - 200P$$

ඉහත සඳහන් භාණ්ඩයේ වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 04)

(ඇ) සෝඩා පිළිබඳව වෙළෙඳ ප්‍රචාරණය තහනම් කර ඇති නම්, පෙප්සි විකුණුම් මත එය ඇතිකරන බලපෑම කෙබඳුවේද? එය සෝඩා පාරිභෝජනයට බලපාන්නේ කවර ආකාරයෙන්ද?

(ලකුණු 05)

(ඈ) විවිධ රජයන් විසින් ගෑස් මත දැනට පනවා ඇති බදු වලට අමතරව රාජ්‍ය බදු පනවනු ලබයි. මෙලෙස ගෑස් මත පනවන බදු වැඩිකිරීමෙන් රාජ්‍ය බදු ආදායමට කුමක් සිදුවේද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(02) (අ) උපේක්ෂා වක්‍ර විශ්ලේෂණය ආශ්‍රයෙන් පාරිභෝගිකයකුගේ සමතුලිතය ඇතිවන ආකාරය විස්තර කරන්න. පාරිභෝගික සමතුලිත කොන්දේසි මොනවාද?

(ලකුණු 05)

(ආ) උපයෝගීතා න්‍යාය හා උපේක්ෂා වක්‍ර විශ්ලේෂණයට සාපේක්ෂව සැමුවෙල්සන්ගේ ප්‍රත්‍යක්ෂවරණ න්‍යාය වඩා විද්‍යාත්මක වන්නේ මන්ද?

(ලකුණු 05)

(ඇ) සාමාන්‍ය භාණ්ඩයක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය විස්තර කරන්න.

(ලකුණු 05)

(ඈ) පීසා අනුභවයෙන් ලැබෙන මුළු උපයෝගීතාවය පහතින් දැක්වෙන වගුවෙන් දක්වා ඇත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පාරිභෝජනය කළ ප්‍රමාණය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| මුළු උපයෝගීතාවය | 47 | 92 | 122 | 135 | 137 | 120 | 70 |

(i) එක් එක් පීසාවෙහි ආන්තික උපයෝගීතාවය කොපමණද?

(ii) ආන්තික උපයෝගීතාවය හීනවීමට බලපාන හේතු සාධකයන් මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(03) (අ) කෙටිකාලීන නිෂ්පාදනයේ යෙදී සිටින තාර්කික නිෂ්පාදකයෙකුට වඩාත්ම සුදුසුම නිෂ්පාදන ප්‍රදේශය හඳුනාගැනීම රූප සටහන් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) කෙටිකාලීනව තම නිෂ්පාදන කටයුතු අවසන් නොකලහොත් ස්ථාවර පිරිවැයෙන් කොටසක්වත් උපලබ්ධිකර ගැනීමට ආයතනයක් අපොහොසත් වන්නේ මන්දැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ඇ) රූප සටහනක් ඇසුරින් නිෂ්පාදකයෙකුගේ ව්‍යාපාර වසා දැමීමේ ලක්ෂ්‍යය යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඈ) එක්තරා ආයතනයක් මුහුණදෙන ඉල්ලුම් ශ්‍රිතය $P = 500 - 0.2Q$ වන අතර පිරිවැය ශ්‍රිතය $TC = 25Q + 10,000$ වේ. ආයතනයේ ලාභ උපරිමකරන මිල මට්ටම හා නිමවුම ගණනය කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(04) (අ) තරඟකාරීත්වය තුලින් ලාභදායීත්වය තුනී වන බව දන දනම පුද්ලයන් වඩා ලාභදායී කර්මාන්ත ක්ෂේත්‍රයන් තුලට පිවිසෙනුයේ මන්දැයි පහදන්න.

(ලකුණු 05)

(ආ) පූර්ණ තරඟකාරී වෙළඳපල ආයතනයක ඉල්ලුම් ශ්‍රිතය $P = 29$ සහ එහි මුළු පිරිවැය ශ්‍රිතය $TC = 1/3Q^3 - 5Q^2 + 28Q + 27$

(i) ලාභය උපරිමකරන නිමවුම සහ මිල මට්ටම ගණනය කරන්න.

(ii) මෙම නිමවුම් මට්ටමේදී ආයතනය උපයන මුළු ලාභය සොයන්න.

(ලකුණු 08)

(ඇ) ඒකාධිකරුවෙකු මිල විශේෂණය අභිමුඛකරගනිමින් විවිධ නම්‍යතාවයන්ගෙන් යුතු වෙළඳපොළ දෙකක් තුල ඔහුගේ නිමවුම බෙදාහැරීමට කටයුතු කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

(05) (අ) ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක ආයතනයක් තම සමතුලිත නිමවුම තීරණය කිරීමේදී මුහුණදෙන ගැටළු මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ආ) මිල ප්‍රභේදනය යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද?

(ලකුණු 04)

(ඇ) මුළු වෙළඳපොළ ඉල්ලුම කාටල සාමාජිකයන් අතර බෙදාහරින්නේ කෙසේදැයි සුදුසු ප්‍රස්ථාර සටහන් යොදාගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඈ) මිල නායකත්ව ආකෘතිය සඳහා ඉදිරිපත් වී ඇති විවේචනයන් මොනවාදැයි දක්වන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(06) (අ) ආදායමේ චක්‍රාකාර ප්‍රවාහයට අනුකූලව ඉතුරුම් - ආයෝජන සමානතාවය ගොඩනගාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ආ) කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබට සපාය ඇත. (සියළු අගයන් රුපියල් මිලියන වලිනි.)

$C = 140 + 0.6yd$ (පාරිභෝජනය)

$Tx = 50 + 0.3y$ (බදු ශ්‍රිතය)

$Tr = 70$ (සංක්‍රාම)

$I = 300$ (ආයෝජන)

$G = 250$ (රාජ්‍ය වියදම)

$X = 420$ (අපනයන)

$M = 120 + 0.25y$ (ආනයන)

(i) මෙම ආකෘතිය සඳහා සමතුලිත ජාතික ආදායම හා වියදම් ගුණකය ගණනය කරන්න.

(ලකුණු 08)

(ii) රාජ්‍ය වියදම 40% කින් වැඩිකලහොත් සමතුලිත ජාතික ආදායම කෙරෙහි ඇතිකරන බලපෑම කුමක්ද?

(ලකුණු 04)

(iii) ආන්තික පාරිභෝජන නැඹියාව හා ආන්තික ඉතුරුම් නැඹියාව අතර පවතින සම්බන්ධතාවය පහදන්න.

(ලකුණු 04)
(මුළු ලකුණු 20)

(07) (අ) "භාණ්ඩ හා සේවා වෙළඳපොළ හා මුදල් වෙළඳපොළ අතර අන්තර් රැඳියාවක් පවතී." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? හේතු දක්වන්න.

(ලකුණු 05)

(ආ) මූර්ථ ප්‍රතිපත්තීන්, මූල්‍ය ප්‍රතිපත්තීන්ගෙන් වෙනස්වන්නේ කවර ආකාරයෙන්ද? ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයක් මූර්ථ ප්‍රතිපත්තීන් තුලින් ලඟාකරගැනීමට බලාපොරොත්තු වන අරමුණු මොනවාද?

(ලකුණු 07)

(ඇ) (i) රජය විසින් මූල්‍ය ප්‍රතිපත්තීන් ලිහිල් කිරීමක්,
(ii) රාජ්‍ය වියදම් අඩු කිරීමක්,

සමතුලිත පොලී අනුපාතිකය හා සමතුලිත ජාතික ආදායමට සිදුකරනු ලබන බලපෑම විස්තර කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

(08) (අ) එළඹෙන ඉදිරි දශකය තුලදී ශ්‍රී ලංකාව තුල පූර්ණසේවා නියුක්ති මට්ටමක් හා මිල ස්ථාවර තත්ත්වයක් ලඟාකර ගැනීම සඳහා සුදුසුයැයි හැඟෙන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් යෝජනා කරන්න.

(ලකුණු 10)

(ආ) "උද්ධමනය සහ සේවා වියුක්තිය අතර වාසි හුවමාරුව පැහැදිලිවම තාවකාලික වේ." ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟවන්නේද? හේතු දක්වන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)